මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 23/10/2019

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## Human Rights Commission of Sri Lanka

සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
සරණ පාර,
රාජගිරිය.

ගරු සභාපතිතුමනි,

**පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට ජාතික මැතිවරණ වලදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම**

උක්ත කරුණ පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකරන ලද ලිපිය ඔබගේ කාරුණික අවධානයට හා අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ යොමු කරමු.

මේ පිළිබඳව ඔබගේ සහාය අගය කරන්නෙමු.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

ආචාර්ය දීපිකා උඩගම,
සභාපතිනිය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2019 ඔක්තොම්බර් මස 23

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 23/10/2019

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# Human Rights Commission of Sri Lanka

ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
2 වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

**පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට ජාතික මැතිවරණ වලදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම**

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ විධි විධාන නිසි ලෙස ක්‍රියාකරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් එම නීතීන් හා අයිතිවාසිකම් වලට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක, පරිපාලනමය පිළිවෙත් පිළිබඳ සුපරීක්ෂාවෙන් සිට නීතිමය හා පරිපාලනමය කාර්යය පටිපාටීන් සකස්කිරීමෙහිලා රජයට අවශ්‍ය උපදෙස් ලබාදීම, සහායවීම සහ එම කාර්යය නිසි පරිදි අදාළ ආයතන විසින් ක්‍රියාත්මක කරන්නේ ද යන්න පිළිබඳව හා ඉහත අවශ්‍යවන්නා වූ සියළු දේ කිරීමට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව බලතල අප කොමිෂන් සභාවට හිමිව ඇත.

2014 දෙසැම්බර් මස 22 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කම්කරු අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සහ මැතිවරණ කොමසාරිස්වරයාගේ සහභාගීත්වයෙන් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට ජාතික මැතිවරණ වලදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම පිළිබඳ විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී. උක්ත සාකච්ඡාව පදනම්ව 2015 ජනවාරි මස 08 වෙනිදාට යෙදී තිබූ ජනාධිපතිවරණයේ දී පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට ඡන්දය භාවිතා කිරීම සඳහා 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත ප්‍රකාරව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පෞද්ගලික අංශය සඳහා ලබාදිය යුතු නිවාඩු කාලසීමාවන් දක්වන ලිපියක් 2014.12.23 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. එය පදනම් කර 2015 ජනවාරි 08 දින පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්හට නිවාඩු ලබාදිම පිළිබඳව ප්‍රසිද්ධ නිවේදනයක් ඔබ දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් වල පළකරන ලදී.

ඒ අනුව උක්ත මැතිවරණයේ දී සිය සර්වජන ඡන්දය පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට බාධාවකින් තොරව ලබාගැනීමට අවස්ථාව උදාවිය. මෙවර ජනාධිපති මැතිවරණයේ දී ද **"කිසිවෙකු අත්නොහැරෙන මැතිවරණයක් තහවුරු කරමු"** යන තේමාව ඔස්සේ පුරවැසියන්ගේ පරමාධිපත්‍ය ඡන්දය ප්‍රකාශකිරීම තුළින් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කටයුතු කරමින් ඇත. පුරවැසියන්ගේ පරමාධිපත්‍ය තහවුරු කරගැනීම සඳහා පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට


ප්‍රධාන කාර්යාලය | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.
தலைமைக் காரியாலயம் | 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.
Head Office | 14, R.A.De Mel Mawatha, Colombo - 04.

සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com

දුරකථන / தொலைபேசி / Telephone: 94-11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ජාතික මැතිවරණ වලදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් නිවේදනයක් කිරීම වැනි මැදිහත්වීම් සුදුසු බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලබයි. ඒ අනුව ඔබ අමාත්‍යාංශය මේ සඳහා කඩිනම් සුදුසු මැදිහත්වීමක් සිදුකරනු ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරනු ලැබේ.

2014 දෙසැම්බර් මස 22 දින සාකච්ඡාව පදනම් කර පෞද්ගලික අංශයේ සේවකයින්හට ජාතික මැතිවරණ වලදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම සම්බන්ධ ක්‍රමවේදය ඇතුළත් මැතිවරණ කොමසාරිස්තුමාගේ 2014.12.23 දිනැති ලිපියේ පිටපතක් සහ මේ සම්බන්ධයෙන් කම්කරු අමාත්‍යාංශය විසින් සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළ කල පුවත්පත් දැන්වීම් පිටපත් ද ඔබගේ කාරුණික අවධානය සඳහා මේ සමඟ යොමු කරමු.

ආචාර්ය දීපිකා උඩගම,
සභාපතිනිය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

2019 ඔක්තොම්බර් මස 23

පිටපත : සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව.

4-23
1409

# මැතිවරණ දෙපාර්තමේන්තුව
# தேர்தல்கள் திணைக்களம்

RECEIVED 29 DEC 2014

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත, රාජගිරිය (10107)
தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107).

*web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk*

මගේ අංකය : PRE/2015/04 ඔබේ අංකය : දිනය : 2014.12.23
எனது இல. உமது இல. திகதி

සභාපතිතුමා, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,
ලේකම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,
ලේකම් (නීති), ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,

**ජනාධිපතිවරණය - 2015**
**පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයවළුන්ට, ජාතික මැතිවරණ වලදී වැටුප් හෝ පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම.**

ඉහත කරුණට අදාළව 2014.12.22 දින ගරු කොමිෂන් සභාව විසින් කම්කරු අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමසාරිස්, අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති) කැඳවා කොමිෂන් සභාවේ ගරු සභාපතිතුමා, ගරු කොමසාරිස්වරු හා නීති ලේකම්වරයා ඇතුලු සෙසු නිලධාරීන් සමඟ මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වනු ලැබූ සාකච්ඡාව හා බැඳේ.

02. තම ඡන්දය දීමට හැකි වනු පිණිස සේවා නියුක්තීන්ට නිවාඩු දීමට සේවා යෝජකයින් කටයුතු කළ යුතු බවට 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 110 වැනි වගන්තියෙන් විධිවිධාන සලසා ඇති අතර 2015.01.08 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ දී ද එය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතුව ඇත.

03. රාජ්‍ය අංශයේ, නිලධරයන්ගේ විශේෂ නිවාඩු පිළිබඳව ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 12.3 ඡේදයේ දක්වා ඇති පරිදි, ජනාධිපතිවරණයක් සඳහා අවම කාලය පැය 4ක් ලෙස හා ඡන්දය ප්‍රකාශ කිරීමට යාම පිණිස අවශ්‍යයැයි හැඟෙන අඛණ්ඩ කාලයක් සඳහා වැටුප් අඩු කිරීමක් නොමැතිව විශේෂ නිවාඩු ලබා දියයුතු බව ද දක්වා ඇත. ඒ අනුව රජයේ නිලධරයන්ට ගැටළුවකින් තොරව තම ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවකාශ සලසා ගත හැක.

04 නමුත් පෞද්ගලික අංශයේ, සේවා නියුක්තීන්ට ලිඛිත ලේඛනයකින් පැනවූ එවැනි විශේෂ නිවාඩු ලබා දීමේ ක්‍රමවේදයක් නොමැති හෙයින් බොහෝ සේවා යෝජකයින් තම සේවා නියුක්තීන්ට ඡන්දය පාවිච්චි කිරීම සඳහා වූ නිවාඩු ලබා නොදෙන බවට පසුගිය ඡන්ද විමසීම් කිහිපයේදීම පැමිණිලි ලැබී ඇති බැවින් පෙර සඳහන් සාකච්ඡාවෙන් අනතුරුව පෞද්ගලික අංශයේ සේවකයින්ට ජාතික මැතිවරණ වලදී ඡන්දය පාවිච්චි කිරීමට යැමට හා ඊමට නිවාඩු ලබා දීම සඳහා දුර හා කාලය අතර සම්බන්ධතාවක් සකස්කරන ලෙස ගරු කොමිෂන් සභාව විසින් කරන ලද දැන්වීම අනුව මතු සඳහන් වගුවට අනුකූලව පෞද්ගලික අංශයේ සේවය කරන්නා වූ සේවක සේවිකාවන්ට, සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වූ නිවාඩු ලබාදීමට අදාළ සේවා යෝජකයින් කටයුතු කිරීම සුදුසු බවට කාරුණිකව යෝජනා කරමි.

| ඡන්දය පාවිච්චි කිරීම සඳහා සේවා ස්ථානයේ සිට තම ඡන්ද පොළට යා යුතු දුර ප්‍රමාණය. | ලබා දියයුතු අවම නිවාඩු කාලසීමාව |
|---|---|
| - කි.මී. 40 ක් හෝ ඊට අඩු නම් | දින භාගයයි. |
| - කි.මී. 40 ත් - 100 ත් අතර නම් | දින එකයි. |
| - කි.මී. 100 ත් - 150 ත් අතර නම් | දින 1 1/2 යි. |
| - කි.මී. 150 ට වැඩි නම් | දින 2 යි. |

05. ඉහත සටහනින් යෝජනා කර ඇත්තේ අවම කාලය වන අතර දිවයිනේ සමහර ඡන්දදායකයින්ට ඡන්ද පොළට යැමට, ඊමට හා ඡන්දය පාවිච්චිය සඳහා දින තුනක් අවශ්‍යවන අවස්ථා ද සැලකිය යුතු ප්‍රමාණයක් තිබේ. එබැවින් අවස්ථාවෝචිතව දින තුනක් නිවාඩු දීමට සිදු වන බවද සැලකිල්ලට ගත යුතු වේ.

06. සියළුම ජාතික මැතිවරණ පැවැත්වීම සඳහා දින නියම කිරීමේදී එකී මැතිවරණ සෙනසුරාදා දිනවලදී පැවැත්වීමට නියමයක් කළ හැකි නම් මෙම නිවාඩු ලබාදීම හේතුවෙන් රටේ ආර්ථිකයට වන බලපෑම අවම කර ගත හැකි බවද කාරුණිකව වාර්තා කර සිටිනු රිසියෙමි.

07 මෙහිදී, සේවා නියුක්තීන් විසින් ලිඛිත ඉල්ලීමක් මඟින් නිවාඩු ඉල්ලුම් කළ යුතු අතර, සෑම සේවා යෝජකයකු විසින්ම විශේෂ නිවාඩු ඉල්ලුම්කළ තැනැත්තන් හා නිවාඩු ප්‍රදානය කරන කාලසීමාව දැක්වෙන ලේඛනයක් පිළියෙළ කර එය, සේවා ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු ද.වේ.

08. ඉහත 05 හා 06 ඡේදයේ සඳහන් යෝජනා ඔබගේ කාරුණික දැනගැනීම සඳහා හා සුදුසු කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පිටපත: ලේකම් - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය - දැනගැනීම සඳහා කාරුණිකව

දිනමිණ ePaper

100%

# ජනාධිපතිවරණය - 2015.01.08

## ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පෞද්ගලික අංශයේ සේවකයන් වෙත නිවාඩු ලබාදීම

මැතිවරණ කොමසාරිස් විසින් යෝජනා කරන ලදුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිර්දේශිත මතු දැක්වෙන කාලසීමාවන් 2015.01.08 වන දින පැවැත්වෙන ජනාධිපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සිය සේවා ස්ථානයේ සිට ඡන්දය ප්‍රකාශ කරන ස්ථානය වෙත යාමට හැකිවන පරිදි වැටුප් සහිත විශේෂ නිවාඩුවක් ලබාදීමට අවශ්‍ය වන බව පෞද්ගලික අංශයේ සේවායෝජකයන් වෙත දන්වා සිටිමි.

| ඡන්දය පාවිච්චි කිරීම සඳහා සේවා ස්ථානයේ සිට තම ඡන්ද පොළට යා යුතු දුර ප්‍රමාණය | ලබාදිය යුතු අවම නිවාඩු කාලසීමාව |
|---|---|
| - කි.මී. 40 ක් හෝ ඊට අඩු නම් | දින භාගයකි |
| - කි.මී. 40 ත් 100 ත් අතර නම් | දින එකකි |
| - කි.මී. 100 ත් - 150 ත් අතර නම් | දින 1 1/2 |
| - කි.මී. 150 ට වැඩි නම් | දින 02 |

02. ඉහත දක්වා ඇති කාලසීමාව අවම කාලසීමාවක් වන අතර එම කාලසීමාව ප්‍රමාණවත් නොවන්නේ නම් ඡන්දය ප්‍රකාශ කිරීමට යාම සහ ඒම සඳහා දින තුනක් අවශ්‍ය වන අවස්ථාවකදී සේවායෝජකයන් විසින් ඒ සම්බන්ධයෙන් සලකා බලා කටයුතු කිරීම අවශ්‍ය වේ.

03. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනතේ 110 වන වගන්තියේ විධිවිධාන අනුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා යාමට විශේෂ නිවාඩු අනුමත කරනු ලැබූ සේවකයන්ගේ නම් සහ නිවාඩු ලබාදුන් කාලසීමාවක් දැක්වෙන ප්‍රකාශනයක් සේවායෝජක විසින් සිය සේවා ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමද අවශ්‍ය වේ.

04. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනතේ 110 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් සේවායෝජකයෙකුට විරුද්ධව නීති මඟින් කටයුතු කිරීමේ බලතල පවතින බව ද දන්වා සිටිමි.

**ගාමිණී ලොකුගේ**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය

2015 ජනවාරි 02 වන දින
කොළඹ 05,
කම්කරු මහලේකම් කාර්යාලයේ
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ දී ය.

தினகரன் ePaper



# ஜனாதிபதி தேர்தல் 08.01.2015

## வாக்குகளை வழங்க உதவும் வகையில் தனியார் துறையைச் சேர்ந்த ஊழியர்களுக்கு விசேட விடுமுறையை வழங்குதல்

எதிர்வரும் 2015 சனவரி 08ஆம் திகதி நடைபெறவுள்ள ஜனாதிபதி தேர்தலுக்கு வாக்குகளை வழங்க உரித்துடைய அனைத்து தனியார் துறையைச் சேர்ந்த சகல ஊழியர்களுக்கும் தாங்கள் வாக்குகளை வழங்க வாக்கு வழங்கும் நிலையத்திற்கு செல்ல உதவும் வகையில் அவர்கள் தொழில் புரியும் இடத்திலிருந்து அவர்களது வாக்கு வழங்கும் நிலையத்திற்குமிடையில் உள்ள தூரத்தைக் கருத்தில் கொண்டு, தேர்தல்கள் ஆணையாளரால் முன்வைக்கப்பட்டதும், மனித உரிமைகள் ஆணைக் குழுவினால் சிபாரிசு செய்யப்பட்டதுமான கீழே கொடுக்கப்பட்ட அட்டவணையின் காலவரையறையின் பிரகாரம் சம்பளத்துடனான விசேட விடுமுறையை வழங்குமாறு நாட்டிலுள்ள சகல தொழில் தருநர்களுக்கும் இத்தால் அறியத்தருகின்றேன்.

| தொழில் புரியுமிடத்திற்கும் வாக்கு வழங்கும் நிலையத்திற்கும் இடைப்பட்ட தூரம் | விடுமுறை வழங்கப்பட வேண்டிய ஆகக் குறைந்த கால அளவு |
|---|---|
| 40 கி.மீ. அல்லது அதிலும் குறைவான தூரம் ஆயின் | அரை நாள் |
| 40 கி.மீ. இற்கும் 100 கி.மீ. இற்கும் இடைப்பட்ட தூரம் ஆயின் | ஒரு நாள் |
| 100 கி.மீ. இற்கும் 150 கி.மீ. இற்கும் இடைப்பட்ட தூரம் ஆயின் | 1 ½ நாள் |
| 150 கி.மீ. இற்கு மேற்பட்ட தூரம் ஆயின் | 2 நாட்கள் |

02. மேலே குறிப்பிடப்பட்ட கால அளவு மிகக்குறைந்தது ஆகும் என்பதுடன் தொழில் புரியும் இடத்திலிருந்து வாக்குகளை வழங்கும் நிலையத்திற்குச் சென்று திரும்பவும் தொழில் புரியுமிடத்திற்கு வந்து சேர வேண்டிய கால அளவு மேற்குறிப்பிட்ட கால அளவுடன் போதுமானதாக இல்லாத சந்தர்ப்பத்தில் அதாவது அதற்கு மூன்று நாட்கள் தேவைப்படுமாயின் தொழில் தருநர்கள் அது தொடர்பாக தேவையான நடவடிக்கைகளை எடுத்தல் வேண்டும்.

03. 1981ஆம் ஆண்டின் 15 ஆம் இலக்க ஜனாதிபதி தேர்தல்கள் சட்டத்தின் 110ஆம் பிரிவின் ஏற்பாடுகளின் கீழ் ஒவ்வொரு தொழில் தருநரும், விடுமுறை வழங்கப்பட்டவர்களின் பெயர்களின் விபரம் மற்றும் வாக்குகளை வழங்க அவர்களுக்கு வழங்கப்பட்ட விசேட விடுமுறையின் கால அளவு என்பவற்றைக் கொண்ட அட்டவணையைத் தயாரித்து அதனை வேலைத்தளத்தில் ஓர் பொருத்தமான இடத்தில் காட்சிப்படுத்துதல் வேண்டும்.

04. 1981ஆம் ஆண்டின் 15ஆம் இலக்க ஜனாதிபதி தேர்தல்கள் சட்டத்தின் 110ஆம் பிரிவின் ஏற்பாடுகளை மீறும் எந்த ஓர் தொழில் தருநரும் சட்ட நடவடிக்கைக்கு ஆளாக்கப்படுவர்.

காமினி லொக்குகே
தொழில், தொழில் உறவுகள் அமைச்சர்

தொழில், தொழில் உறவுகள் அமைச்சு
தொழில் செயலகம்,
கொழும்பு 05.
02.01.2015

Produced by Lake House Copyright © 2013-2014 The Associated Newspapers of Ceylon Ltd.

# PRESIDENTIAL ELECTION
# 08-01-2015

## LEAVE TO ENABLE EMPLOYEES OF THE PRIVATE SECTOR TO VOTE

It is informed to all the private sector employers to grant a special leave with pay to the employees in private sector who have the entitlement to vote in the Presidential Election on 08.01.2015 so as to enable them to go to cast their vote, considering the distance between the workplace and the polling station, the undermentioned time limits proposed by the Commissioner of Elections and recommended by Sri Lanka Human Rights Commission.

| The distance between Workplace and Polling Station | Minimum time limit allowed |
|---|---|
| If 40 km or lesser | 1/2 day |
| If between 40km - 100 km | 1 day |
| If between 100km - 150 km | 1 1/2 days |
| If more than 150 km | 2 days |

02. Above mentioned time limit is a minimum duration and in case of inadequacy of such time limit to travel to polling station and back to workplace and if it is needed 3 days for that the employers should consider over it and should be taken necessary measures.

03. Under the provisions of Section 110 of the Presidential Election Act No.15 of 1981, every employer should prepare a list including the names of whose special leave have been approved and the time limit granted for them to cast their vote and it should be exhibited at a suitable place in the workplace.

04. Any employer who violates the provisions of the Section 110 of the Presidential Election Act No.15 of 1981 shall be liable to be subjected to legal action.

**Gamini Lokuge**
**Minister of Labour and Labour Relations**

**Ministry of Labour and Labour Relations**
**Labour Secretariat, Colombo.**
*02nd January 2015*

Produced by Lake House Copyright © 2009 - 2015 The Associated Newspapers of Ceylon Ltd.